| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 7 ශ්‍රේණිය | **විද්‍යාව** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

1) පුෂ්පයක් පරාගනයෙන් පසු ඵලයක් බවට පත්වන්නේ පුෂ්පයේ කුමන කොටසද?
(i) පරාගධානිය
(iii) ඩිම්බ කෝෂය
(ii) පරාගය
(iv) කලංකය

2) ඒක බීජ පත්‍රී ශාක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(i) බෝංචි, මෑ, රටකජු
(ii) වී, පොල්, බඩ ඉරිඟු
(iii) පොල්, පුවක්, බෝංචි
(iii) වී, බෝංචි, පොල්

3) නිවසේදී භාවිතා කළ හැකි භෂ්මයක් හා අම්ලයක් දැක්වෙන පිළිතුර පිළිවෙලින් දක්වා ඇත්තේ කුමන පිළිතුරෙහිද?
(i) විනාකිරි, සබන්දියර
(iii) සබන් දියර, අළු දියර
(ii) දෙහි යුෂ, සබන් දියර
(iv) සබන් දියර, විනාකිරි

4) ශක්තිය මනිනු ලබන අන්තර්ජාතික ඒකකය වන්නේ,
(i) වොට් (ii) ඕම් (iii) ෆැරඩ් (iv) ජූල්

5) පෘෂ්ඨවංශීන් පමණක් අයත්වන පිළිතුර කුමක්ද?
(i) කැරපොත්තා, ගෝනුස්සා
(iii) කුඩැල්ලා, කැස්බෑවා
(ii) නයා, පිළිහුඩුවා
(iv) උකුස්සා, ගෝනුස්සා

6) පහත දැක්වෙන කුමන ද්‍රාවණය පිනොප්තලීන් එකතු කළ විට රෝස පැහැ වේද?
(i) තනුක සල්ෆියුරික් අම්ලය
(iii) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්
(ii) සෝඩියම් ක්ලෝරයිඩ් ද්‍රාවණය
(iv) තනුක හයිඩ්‍රක්ලෝරික් අම්ලය

7) තල දර්පණ දෙකක් රූපයේ පරිදි $60^\circ$ ක කෝණයකින් තබා ඒ ඉදිරියේ දැල්වූ ඉටි පන්දමක් තැබුවේ නම් සෑදෙන ප්‍රතිබිම්බ සංඛ්‍යාව වන්නේ,
(i) දෙකකි
(ii) තුනකි
(iii) හතරකි
(iv) පහකි



8) බහු සෛලික ජීවී දේහ සංවිධාන මට්ටම් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(i) සෛල ⟶ අවයව ⟶ පටක ⟶ පද්ධති ⟶ ජීවියා
(ii) සෛල ⟶ පටක ⟶ අවයව ⟶ පද්ධති ⟶ ජීවියා
(iii) සෛල ⟶ පද්ධති ⟶ පටක ⟶ අවයව ⟶ ජීවියා
(iv) ජීවියා ⟶ පද්ධති ⟶ අවයව ⟶ පටක ⟶ සෛල

9) ශ්‍රී ලංකාව අයත් වන භූ තැටිය වන්නේ,

(i) උතුරු ඇමරිකා භූ තැටිය
(ii) දකුණු ඇමරිකා භූ තැටිය
(iii) පැසිපික් භූ තැටිය
(iv) ඔස්ට්‍රේලියන් - ඉන්දියන් භූ තැටිය

10) මානව ශ්වසන පද්ධතියට හා ආහාර ජීර්ණ පද්ධතියට පොදු ව්‍යුහය කුමක්ද?

(i) ස්වරාලය
(ii) ස්වාසනාලය
(iii) ග්‍රසනිකාව
(iii) අන්නස්‍රෝතය

- **ප්‍රශ්න අංක 11 හා 12 මෙම රූපය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**




11) වායුගෝලයේ ප්‍රධාන ස්තර පහ $A, B, C, D, E$ ලෙස දැක්වේ. එහි මධ්‍යගෝලය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(i) $A$
(ii) $B$
(iii) $C$
(iv) $D$

12) ඕසෝන් වියන හෙවත් ඕසෝන් ස්තරය පිහිටා ඇති අක්ෂරය හා එහි නම නිවැරදිව දැක්වෙන්නේ,

(i) $A -$ පරිවර්තී ගෝලය
(ii) $B -$ තාප ගෝලය
(iii) $B -$ ස්තර ගෝලය
(iv) $C -$ තාප ගෝලය

13) ජීවීන්ගේ ශ්වසන ක්‍රියාවලිය පහත සමීකරණයෙන් දැක්වේ. එහි හිස්තැන් සඳහා සුදුසු පිළිතුර තෝරන්න.

සරල ආහාර $+$ $A$ $\longrightarrow$ ශක්තිය $+$ $B$ හා ජල වාෂ්ප

(i) $A$ කාබන්ඩයොක්සයිඩ් $B$ ඔක්සිජන්
(ii) $A$ ඔක්සිජන් $B$ කාබන්ඩයොක්සයිඩ්
(iii) $A$ ග්ලූකෝස් $B$ කාබන්ඩයොක්සයිඩ්
(iv) $A$ ග්ලූකෝස් $B$ ඔක්සිජන්

14) පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.

$(A)$ රික්තයක් තුළින් වුවද ධ්වනිය ගමන් කරයි
$(B)$ වාතය තුළින් ධ්වනිය ගමන් කරයි
$(C)$ ධ්වනිය ගමන් කිරීමට මාධ්‍යක් අවශ්‍ය වේ
$(D)$ වාතය තුළ ධ්වනි වේගය ආලෝකයේ වේගයට වඩා වැඩිය

(i) $A$ හා $B$
(ii) $B$ හා $C$
(iii) $A$ හා $C$
(iv) $A, B$ හා $D$

15) ආලෝක විමෝචක ඩයෝඩයක සංකේතය වන්නේ,

(i) 

(ii) 
(iii) 
(iv) 

16) බහුරූපේක්ෂය සෑදීමට අවශ්‍ය දර්පණ වර්ගය හා දර්පණ සංඛ්‍යාව දැක්වෙන පිළිතුර කුමක්ද?

(i) උත්තල දර්පණ - 3
(ii) අවතල දර්පණ - 3
(iii) තල දර්පණ - 3
(iv) අවතල දර්පණ - 2 හා උත්තල දර්පණ - 1

17) මිනිස් ආහාර ජීරණ පද්ධතියේ දිගින් වැඩිම අවයවය වන්නේ,

(i) අන්නස්‍රෝතය (iii) මහා අන්ත්‍රය

(ii) කුඩා අන්ත්‍රය (iv) ගුද මාර්ගය

18) අම්ල වැසි ඇති වීමට බලපාන ප්‍රධාන වායුව වන්නේ,

(i) සල්පර්ඩයොක්සයිඩ් (iii) නයිට්‍රජන්

(ii) කාබන්ඩයොක්සයිඩ් (iv) මෙතෙන්

19) රසායනික ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය කරන උපකරණය

(i) ට’ර්බයිනය (iii) ඩයිනමෝව

(ii) විදුලි සීනුව (iv) වියළි කෝෂය

20) ජාලාභ නාරටි වින්‍යාසයක් ඇති පත්‍ර තිබෙන ශාකය වන්නේ,

(i) දොඩම් (ii) බඩ ඉරිඟු (iii) පොල් (iv) ගොයම්

## *II* කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

(1) පහත දී ඇති ද්‍රව්‍ය, උපකරණ හඳුනාගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i)




$(a)$ $A, B, C$ කොටස් නම් කර ඒවායේ කෘත්‍ය බැගින් ඉදිරියෙන් ලියන්න. (ල. 06)

| | කොටස | කාර්යය |
|---|---|---|
| $A$ | | |
| $B$ | | |
| $C$ | | |

$(b)$ $C$ හි භාවිතා වන කාච වර්ගය කුමක්ද? (ල. 01)



(ii) මෙම උපකරණය හඳුන්වන නම කුමක්ද? (ල. 01)

(iii) එහි කාර්යය ලියන්න. (ල. 01)

(iv)



(a) මෙම උපකරණය හඳුනාගෙන නම් කරන්න. (ල. 01)

(b) මෙය ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවන් 2ක් නම් කරන්න. (ල. 02)

(v) මෙම රූපයෙන් දැක්වෙන අවස්ථාවේ ගබඩා වී ඇති ශක්ති ආකාරය කුමක්ද?(ල. 02)

(vi) මෙය ක්‍රියාත්මක කල විට සිදුවන ශක්ති පරිණාමය ලියා දක්වන්න. (ල. 02)



(2) පහත දැක්වෙන්නේ පෘථිවි වායුගෝලයේ ඇති ස්ථර දැක්වෙන රූප සටහනකි.




(i) ඉහත රූපයේ දැක්වෙන $A, B, C$ ස්ථර පිළිවෙලින් නම් කරන්න. (ල. 03)

(ii) ඉහත ස්ථර අතරින් වැඩිම වායු පරිමාවක් අඩංගු ස්ථරය හැඳින්වෙන නම කුමක්ද? (ල. 01)

(iii) $A$ ලෙස දක්වා ඇති ස්ථරය මගින් ජීවීන්ට ඇති වැදගත්කමක් ලියන්න. (ල. 01)

(iv) ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ කුමන ගෝලය තුළද? (ල. 01)

(v) ඉහත ස්ථර අතරින් සිසිල්ම ස්ථරය කුමක්ද? (ල. 01)

(vi) ස්ථර ගෝලයේ ඉහළට යන විට උෂ්ණත්වය ක්‍රමයෙන් වැඩි වේ. එයට හේතුව කුමක්ද? (ල. 01)

(vii) ජෙට් යානා ගමන් කරනුයේ කුමන ස්ථරය තුලද? (ල. 01)

(viii) වායු දූෂණයට හේතුවන අංශුමය දූෂක 2ක් නම් කරන්න. (ල. 02)

(3) පහතින් දක්වා ඇත්තේ ඡායාව ලබා ගැනීම සඳහා සිසුන් සිදු කල ක්‍රියාකාරකම රූප සටහනකි.




(i) ඉහත ඡායාවේ $A$ හා $B$ කොටස් 2ක නම් කරන්න. (ල. 02)

(ii) ඡායාවක් ලබා ගැනීමට ඉහත වස්තුව කුමන ලක්ෂණයක් සහිත විය යුතුද? (ල. 02)

(iii) ආලෝක ප්‍රභවය වස්තුවෙන් ඈතට ගෙන යාමේදී ඡායාවේ සිදුවන වෙනස කුමක්ද? (ල. 01)

(iv) පහතින් දක්වා ඇත්තේ තල දර්පණයට පතනය වන ආලෝක කිරණයක් පරාවර්තනයට ලක්වන ආකාරයයි. මෙහි $AB$ හා $BC$ කිරණ නම් කරන්න. (ල. 02)

(v) පහතින් දැක්වෙන්නේ තල දර්පණ 2ක් ප්‍රයෝජනයට ගෙන සාදා ඇති උපකරණයක රූප සටහනකි. මෙහි කිරණ සටහන සම්පූර්ණ කරන්න. (ල. 02)




(vi) මෙම උපකරණයේ නම කුමක්ද? (ල. 01)

(vii) මෙය ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් නම් කරන්න. (ල. 01)



(4) $(A)$ පහත දී ඇත්තේ තාපය සතු ශක්තිය ප්‍රයෝජනයට ගත හැකි අවස්ථාවක් ආදර්ශනය සඳහා සකස් කරන ලද ඇටවුමකි.




(i) ශක්තිය යනු කුමක්ද? (ල. 01)

(ii) ඔබ දන්නා ශක්ති ආකාර 2ක් ලියන්න. (ල. 02)

(iii) ඉහත ක්‍රියාකාරකමේදී දැකිය හැකි නිරීක්ෂණයක් ලියන්න. (ල. 01)

(iv) මෙම ක්‍රියාකාරකමේදී සිදුවන ශක්ති විපර්යාසය / පරිවර්තනය ලියන්න. (ල. 02)

(v) මෙම ඇටවුම ක්‍රියාත්මක වීමේදී ශක්ති ප්‍රභවය ලෙස ක්‍රියාකරන්නේ කුමක්ද? (ල. 01)

$(B)$ පහත දක්වා ඇත්තේ පෘථිවියේ අභ්‍යන්තර ස්ථර නිරූපණය කරන රූප සටහනකි.




(i) මෙහි $A, B, C, D$ ස්ථර නම් කරන්න. (ල. 02)

(ii) පෘථිවි ප්‍රාවරණයේ බහුලව අඩංගු මූලද්‍රව්‍ය නම් කරන්න. (ල. 01)

(iii) භූමිකම්පාවක් ඇති වීමේදී සිදු වන්නේ කුමක්ද? (ල. 01)

(5) විද්‍යාගාරයේදී විද්‍යුත් ප්‍රභවයක් ලෙස භාවිතා කරන රසායනික කෝෂයක රූප සටහනක් පහතින් දැක්වේ.




(i) මෙහි $A$ හා $B$ ලෝහ තහඩු නම් කරන්න. (ල. 02)

(ii) මෙහි $C$ ලෙස බීකරයට යොදා ඇති ද්‍රාවණය කුමක්ද? (ල. 01)

(iii) මෙහි සිදුවන ශක්ති පරිණාමනය ලියන්න. (ල. 02)

(iv) මෙම රසායනික කෝෂය ක්‍රියාත්මක වීමේදී දක්නට ලැබෙන නිරීක්ෂණ 2ක් ලියන්න. (ල. 02)

(v) ඩයිනමෝවක විද්‍යුත් ශක්තියහ ටගැනීමට හේතුවන මූලධර්මය කුමක්ද? (ල. 02)

(vi) බයිසිකල් ඩයිනමෝවකින් විදුලි නිපදවන අවස්ථාවේදී එහි භ්‍රමණයක් ඇතිවන්නේ කුමන කොටස් තුලද? (ල. 02)

(6) විද්‍යාගාරයේ භාවිතා කරන ද්‍රව්‍ය කිහිපයක් පහතින් දැක්වේ.

| | | |
|---|---|---|
| 1. විනාකිරි | 2. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් | 3. සෝඩියම් ක්ලෝරයිඩ් |
| 4. පිනොප්තලීන් | 5. ආස්‍රැත ජලය | 6. ආප්ප සෝඩා |
| 7. මැග්නීසියම් ක්ෂීරය | 8. පොකුරු වදමල් යුෂ | 9. කහ දියර |

(i) භාෂ්මික ද්‍රව්‍ය තෝරා ලියන්න. (ල. 02)

(ii) $P^H$ කඩදාසිය රතු පැහැයට හරවන ද්‍රව්‍ය ඉහතින් තෝරා ලියන්න. (ල. 02)

(iii) එහි $P^H$ අගය පරාසය කුමක්ද? (ල. 02)

(iv) උදාසීන ද්‍රව්‍ය මොනවාද? (ල. 02)

(v) ගැස්ට්‍රයිටීස් රෝගයට ප්‍රතිකාර ලෙස ලබා දෙන ද්‍රව්‍ය කුමක්ද? (ල. 01)

(vi) ස්වභාවික ද්‍රව්‍ය ඇසුරෙන් සාදාගන්නා දර්ශක දෙකක් නම් කරන්න. (ල. 02)

(7) $(A)$ වැසි දිනකදී අහස නිරීක්ෂණය කරමින් සිටි දරුවෙකු විදුලි කෙටීමේදී ඇතිවන ආලෝකය පළමුව දිස්වන බවද, අකුණු ගසන ශබ්දය ඇසෙනුයේ එයට පසුව බවද නිරීක්ෂණය කළේය.

(i) ඉහත නිරීක්ෂණයට හේතුව කුමක් විය හැකිද? (ල. 01)

(ii) 7 ශ්‍රේණියේ සිසුන් පිරිසක් ධ්වනිය සම්ප්‍රේෂණය වීම සඳහා මාධ්‍යයක් අවශ්‍ය බව පෙන්වීමට කරන ලද සරල පරීක්ෂණයක ඇටවුමක් පහත දැක්වේ. එහි නිරීක්ෂණ කෙබඳු වේද? (ල. 03)




(iii) ඝණ, ද්‍රව, වායු මාධ්‍යය හරහා ධ්වනිය ගමන් කරන ආකාරය එහි වේගය අනුව ආරෝහණ පිළිවෙලට සකස් කරන්න (ල. 01)

(iv) ඉහත $(iii)$ හි ප්‍රකාශය සඳහා උදාහරණයක් දෙන්න. (ල. 01)

$(B)$




(i) ඉහත පෙන්වා ඇති ආකෘතිය මිනිසාගේ කුමන ක්‍රියාවලිය ආදර්ශනය කිරීමට යොදා ගන්නේද? (ල. 01)

(ii) එම ක්‍රියාවලිය අර්ථ දක්වන්න. (ල. 01)

(iii) ඉහත $A$ හා $B$ වලින් නිරූපිත මිනිස් සිරුරේ ඒවාට අනුරූප ව්‍යුහ මොනවාද? (ල. 02)

(iv) එම ආකෘතිය ක්‍රියාත්මක වීමේදී අපට ලබා ගත හැකි නිරීක්ෂණය කුමක්ද? (ල. 01)